

## මැක්මාන්ස් පොයින්ට් හි දී ය
### රසික සූරියආරච්චි

උද්‍යාන බංකුව මත
සන්ධ්‍යාව ගත කෙරුමට
නිද්‍රාව අමතක කර
වර්ෂාව සපැමිණ ඇත

විශ්‍රාමයෙන් අවදිව
සංවේගයෙන් හඬමින
පක්ෂීහු රැළ දස අත
උන්මාදයෙන් පියඹත

සන්තාපයෙන් තෙත්වුණ
සංකාව සපිරි හද තුළ
සන්තුෂ්ටිය ද ඇති බව
ක්ෂණයකට සිහියට එත!

## නෙළුමෙහි කුහුඹු මිනිසාට
### දුලන්ජන් විතාරම

වළාකුළු සිඹී ඉහළට නැගුනාම
බලා නෙත් අහස මුදුනේ රැඳුනාම
රවා බලන ඉර තරහින් බැලූවාම
නිවා විඩා දුරලා නුඹ ගනු කෝම

පියාඹන කාක පෙරහැර නිරන්තරේ
රහස් කියනවද නැවති හෙමින් සැරේ
කොළඹ සුවඳ හඳුනන්නේ ඔවුන් දොරේ
හිනා වෙලා ඇදපන් බර හෙමින් කරේ

හිරවෙලා හඬන ඒ මිනිසුන් දුටුවාද
හද වෙලාගෙන අඳුර විතරක් රැඳුනාද
පරවෙලා වැටෙන ඒ ජීවිත වැඩි නේද
හිනැහිලා නෙළුම යට ඉන්නට හැකිවේද

සිමෙන්ති සුවඳට හුරු වුණු නුඹට සකී
පලංචියට ඇති වාරුව දෙයියො දකී
රාත්‍රියට ඇස් වැහුනොත් කවුරු රකී
දරාගන්ට දුක උහුලන් ලොවට නොකී

පොළව පලාගෙන පිපෙනා මල දැක්කා
සුවඳ හමා එයි දිනක දි නුඹ එක්කා
නෙළුමට උරය පිට දන් දී එය රැක්කා
කුහුඹු රජුනි නුඹ කිරුලක් නැති සොක්කා



## නත්තලේ අරුත
### ජයසේන කොඩිතුවක්කු

සීතල රැයෙක තරු මල් පිපි දිනෙක එදා
මග සලකුණු කළා එක් තරුවක් රැස් විහිදා
ගව එඬෙරුන් බලා අරුමය දෑස විදා
සතුටින් ඉපිල ගියෙ දැක ළමැසුස්ල බිලිඳා

පව්කම් නිසා දුක් ගිනි මැද දැවෙන සත
මුදවා ගන්න මග හෙළි කළයුතුව ඇත
අරමුණ ඇතිව මෙලොවට එව් දෙව් දූත
ඉපදුනි නමින් පතලව ජේසු දියත

නත්තල් දිනයෙ සිත්ගත් සිදුවීම මෙයයි
බයිබලයෙන් කියන තව තොරතුරු බොහොමයි
වැදගත් වෙන්නෙ කිතුදහමේ ඇති හරයයි
නත්තල් දිනයෙ ඒ ගැන සිහි ක්ළොත් අගෙයි

සාමය බිඳවැටී ලොව හැම තැන යුද්ද
භීතිය රජ කරයි තැන තැන කර සද්ද
භේදය නිසා මිනිසත් ගුණ වැනසේද
උරුමය කාගෙ කාගෙත් හෙට වැළලේද

සාමය පෙරටු කොට නත්තල සිහි කරමු
භේදය සදහටම කවුරුත් පිටු දකිමු
දානය පරිත්‍යාගය දිරිමත් කරමු
ප්‍රේමය හැම දෙනාටම එක ලෙස වඩමු

නත්තල අරුත හැමටම ලොව වැටහේවා
සිත්තුළ සාම සිතුවිලි මල් පිබිදේවා
මෙත්ගුණ සිසිල හැම සිත්තුළ ඉතිරේවා
නත්තල් සාමයෙන් මුළුලොව සැනසේවා



## සුදු පරෙවියෝ ඉකි බින්ද
### ආනන්ද ගුණතිලක
හොපර්ස් ක්‍රොසිං

බර අවි නිහඬ කර හිත සැනසුම කැන්ද
වෛරයෙ ගිණි පුළිඟු පසෙකට කර රන්ද
තිබි අපෙ රටට අද එන හෙන ගෙඩි හින්ද
සුදු පරෙවියෝ හොර රහසෙම ඉකි බින්ද

යා උනි දෙකෙළවර රට මැද සිරි යාවයි
නෑ ගම් බලා නිරතුරු එහෙ මෙහෙ යාමයි
නැතිකර පලුදු - මිතු දම් නැවතත් මෝරයි
බිය සැක නැතිව රට තුල හිරු සඳු පායයි

වෙඩි වරුසා නිසා පෙති වල හිල් හැදුනු
හිත් මල් පිබිදුනා ටික ටික වල් වැදුනු
වියළුනි කඳුළු සහ බිය නෙත් අග රැඳුනු
සෙනෙහස පිබිදුනා හදවත් වල බැඳුනු

මුස්ලිම් දෙමළ පිරිවර හා එක මුතුව
සිංහල පිරිස් හිටියා ලෙස ගප් මුතුව
යුද බිය නිමා වී - රට වැසි හැම සතුව
සාමයෙ මල් පිපුනි මුලු සිරිලක පැතුව

මේ හැම නසා ගෙන බල ලෝභය එන්නේ
ජාතින් අතර ඇති සෙනෙහස වන සන්නේ
බේගල් වලින් හිත මිතුරන් බිඳ ලන්නේ
සමගිය නසන්නට නැවතත් සැර සෙන්නේ

චන්ද්‍රය නැත්තෙ පරදින බව දැනෙන නිසා
නැටුමට බැරිව කියවති මහ පොලොවෙ දෙසා
කොටි රැල වෙතින් රහසෙම එන මුදල නිසා
රට බෙද දමනු ඇත උන් අපෙ දෙනෙත වසා

අද රට කකුස්සකි භාරතයට අයිතී
ඕනෑ විටෙක උන් එහි මළ පහ කරතී
පාලක පඹ පිරිස තුන හතරට නැවෙතී
රට කරවන්න උන්ගේ අවසර පතතී

ජාතියෙ කොඩිය ඔසවන්නට බැහැ කියලා
එක ඇමතියෙක් ඇත උතුරේ උඩු බුරලා
උෟ අල්ලන්න පොලිසිය බය බව දැනිලා
කොටි රැල නටති අද දෙකොනින් හිනහ වෙලා

කන්ණාඩිය නිසා රතු කොළ නිල් පාට
නිවැරදි ඇසින් මනසින් නොම පෙනු නාට
රුධිරය හලා ලක්මව යට කර ඊට
කවුරුද කැමති මිනිසුන් මිය යන වාට

පවතින ඇත්ත කීමට පසු බසිනු එපා
දැන හැඳුනුම නිසා හොරු රැල රකිනු එපා
යුද විරුවනගෙ වටිනාකම නසනු එපා
රට දැය සමය වැනසෙනු දැක නිදනු එපා




ඇය නිතර හැඩවෙන
වර්ණවත් සළුපිළි දැක
ලැජ්ජාවෙන් ඇකිලෙයි
වසත් තුරු පෙළ .

අරුංගල් දිළියුම දැක
ඇස් වහයි ඇස් අරියි
තාරුකා එහෙ මෙහෙ අතුල
නිශා කත .

වක්වූ සඳකට පිටදී
ඈ ලියූ දෑ කියවමි
මා කොහේ කොතැන වෙත්දැයි
නොදැනම.

වර්ණා රසිකා ගුණවර්ධන